පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය - නර්තනය

ශ්‍රේණිය - 13

සතිය - 21

Prepared by – K.K.M.P. Priyanthi
St.Aloysius Collage, Rathnapra.

නිපුණතාව 02		ඃ නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිතා කරයි
නිපුණතා මට්ටම	2.2	ඃ රංග භූමිය හා නූතන වේදිකාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි .
ක්‍රියාකාරකම	2.2	ඃ රංග භූමිය හා නූතන වේදිකාව පිළිබඳ විමසමු .

- **<u>නිවැරදි පිළිතුරු තෝරන්න.</u>**

1. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ දී සකස් කරන මඩුවේ දිග පළල,
   (i). දිගින් 60 රියනයි- පළලින් 60 රියනයි. (ii). දිගින් 30 රියනයි- පළලින් 60 රියනයි.
   (iii). දිගින් 20 රියනයි- පළලින් 30 රියනයි. (iv). දිගින් 60 රියනයි- පළලින් 30 රියනයි.

2. ලෝකයේ ප්‍රථම ස්ථිර ව ගොඩනගන ලද එළිමහන් කවාකාර රංගභූමිය ලෙස සැලකෙන්නේ .
   (i). සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨයයි (ii). ග්‍රීසියේ එපිඩෝස් හි පිහිටි රංග භූමියයි.
   (iii). ග්ලොබ් රඟහලයි (iv). රෝම රංග භූමියයි.

3. ග්‍රීක රගහලේ තියට්‍රොන් යනුවෙන් හඳුන්වන්නේ .
   (i). වාද්‍ය වෘන්දය (ii). නළු නිළි කණ්ඩායම (iii). ප්‍රේක්ශකාගාරය (iv). දියොනීසියස් දෙවියන්

4. එදිරිවීර සරච්චන්ද්‍ර රංග පීඨය
   (i). එළිසබිතන් රගහලේ ආකෘතිය ඇත (ii). ග්‍රීක රංගභූමියේ ආකෘතිය ඇත.
   (iii). රෝම රංගභූමියේ ආකෘතිය ඇත (iv). ග්ලොබ් රගහලේ ආකෘකිය ඇත.

5. එංගලන්තයේ ඉංග්‍රීසි නාට්‍ය කලාවත් සමඟ නිර්මාණය වූ රඟහලකි.,
   (i). ග්ලොබ් රගහල (ii). ග්‍රීක රංගභූමිය (iii). රෝම රංගභූමිය (iv). සංදර්ශන කරත්ත

- **<u>හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .</u>**

6. විලියම් ශේක්ස්පියර්ගේ නිර්මාණයන් සමඟ බිහි වූ රගහල වන්නේ.....රඟහලයි.

7. ශාන්තිකර්මවල දී ගොප්කොළ, හබරල කොළ,තැඹිලි කෙසෙල් බඩ,රඹකැන් පට්ටා වැනි අමුද්‍රව්‍ය යොදා ගන්නේ ..... සැරසීම සඳහා ය.

8. ග්ලොබ් රඟහලේ මධ්‍යයෙහි ඇති විශාල අවකාසය..... යනුවෙන් හඳුනවයි.

9. පින්තූර රාමු වේදිකාව .....නමින් ද හඳුන්වයි.

10. .....ශ්‍රී ලංකාවේ නවීන තාක්ෂණයෙන් යුත් රඟහලයි.

- **<u>සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.</u>**

11. නූතන වේදිකාව කෙටියෙන් හඳුන්වන්න.
12. ග්‍රීක රංග භූමිය හා රෝම රංග භූමියේ ඇති සමාන අසමානතා සාකච්ඡා කරන්න.
13. පින්තූර රාමු වේදිකාවේ සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
14. ''රංග ශාලාවක ප්‍රේක්ෂකයා ද වැදගත් අංගයකි.'' ඉහත කියමන දේශිය ශාන්ති කර්ම රංගභූමිය හා නූතන වේදිකාව ඇසුරෙන් සාකච්ඡා කරන්න.